# ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යංශය

# ජාතික තරුණ සේවා සභාව

# සී/ස තරුණ සේවා සමාගම

## ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම

සී/ස තරුණ සේවා සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පුරප්පාඩුව පවතින ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්**

- වෘත්තීය ගණකාධිකාරී ආයතනයකින් (ACA/ACMA/ACCA) ලබාගත් අවසාන සහතිකය සමග වසර 03 ක විධායක මට්ටමේ ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද **හෝ**
- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය පිළිබඳ සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ලබාගත් විශේෂ උපාධියක් සමග වසර 05 ක විධායක මට්ටමේ පළපුරුද්ද **හෝ**
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී Business Level 1, 11 විභාග සමත් වීම හෝ කළමණාකරණ මූල්‍ය ආයතනයේ 11 කොටස සම්පූර්ණ කිරීම හෝ ලංකා කාර්මික විද්‍යාලයේ ජාතික උසස් ඩිප්ලෝමා සහතිකය හෝ ලබා ඇති විධායක මට්ටමේ ක්ෂේත්‍රය පිළිබඳ වසර 08 ක පළපුරුද්ද.

**ඉහත මූලික සුදුසුකම්වලට අමතරව පහත සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබාදෙනු ලැබේ.**

- රාජ්‍ය ආයතන, බැංකු සහ මූල්‍ය ආයතන සමග කටයුතු කිරීමේ පළපුරුද්ද.
- අවසන් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා සංකල්ප වලට අනුකූලව පිළියෙල කිරීමේ පළපුරුද්ද හා පිළිගත් විගණන සමාගමක විගණක සුපරීක්ෂකවරයෙකු ලෙස සේවය කර තිබීම.
- මාසික මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, මුදල් ප්‍රවාහ ප්‍රකාශන, විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීමේ පළපුරුද්ද සහ සැසඳුම් ප්‍රකාශන, පිරිවැය ගිණුම්කරණ වාර්තා කිරීමේ පළපුරුද්ද.
- අභ්‍යන්තර හා බාහිර විගණකයින් සමග කටයුතු කිරීමේ පළපුරුද්ද සහ අදාළ විගණන කටයුතු සඳහා අවශ්‍ය වන වාර්තා පිළියෙල කිරීමේ පළපුරුද්ද.
- පරිගණක ගිණුම්කරණ පැකේජයන් පිළිබඳ හසළ දැනුමක් සහ පළපුරුද්දක් පැවතීම. Quick Books පැකේජය පිළිබඳ දැනුම හා පළපුරුද්ද විශේෂිතයි.
- වයස් සීමාව අවුරුදු 30-40 විය යුතු වේ.

වැටුප් පරිමාණය - රු. 42,600/= -755 X 10 -1135 X 18 = Rs. 70580/= සමග රජය අනුමත දීමනා

ඉහත සඳහන් සුසුදුකම් සපුරන අයදුම්කරුවන් ඔබ විසින් සකසාගත් ජීවදත්ත පත්‍රිකාව සමග අදාළ සහතිකවල පිටපත් 2022.12.28 වන දින ප.ව. 3.00 ට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය.

ලිපිකවරයේ වම්පස කෙළවරේ "**ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීම**" ලෙස සඳහන් කළ යුතුය. වැඩි විස්තර දුරකථන අංක 0112 745 973 ඇමතීමෙන් ලබාගත හැකිය.

**කළමනාකාර අධ්‍යක්ෂ,**
**සී/ස තරුණ සේවා සමාගම,**
**ජාතික තරුණ මධ්‍යස්ථානය,**
**අංක 65, හයිලෙවල් පාර, මහරගම.**